කවරෙකු සූරා අල්-කහ්ෆ්හි ආරම්භයේ තිබෙන පාඨ දහයක් කටපාඩම් කර ගත්තේ ද ඔහු දජ්ජාල්ගෙන් ආරක්ෂාව ලැබීය. තවත් වාර්තාවක සූරා අල්-කහ්ෆ්හි අවසානයේ යැයි සඳහන් වී ඇත

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබූ දර්දා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: කවරෙකු සූරා අල්-කහ්ෆ්හි ආරම්භයේ තිබෙන පාඨ
දහයක් කටපාඩම් කර ගත්තේ ද ඔහු දජ්ජාල්ගෙන් ආරක්ෂාව ලැබීය. තවත් වාර්තාවක සූරා අල්- කහ්ෆ්හි අවසානයේ යැයි සඳහන් වී ඇත. [صحيح] [رواه مسلم]

කවරෙකු සූරා අල්-කහ්ෆ්හි ආරම්භයේ පාඨ දහයක් කටපාඩම් කරමින් ඒවා ධාරණය කර ගත්තේ ද ඔහු දජ්ජාල්ගේ අර්බුදවලින් ආරක්ෂාව හා රැකවරණය ලබනු ඇත. දජ්ජාල් වන ඔහු අවසන් කාලයේ මතු වී තම දේවත්වය ගැන වාද කරයි. ඔහුගේ අර්බුදය ආදම් (අලයිහිස් සලාම්) තුමා මවනු ලැබූ දා පටන් අවසන් හෝරාව දක්වාම මහපොළොවේ පවතින බරපතලම අර්බුදය වේ. ඔහුව අනුගමනය කරන අය අර්බුදයට පත් කරන අද්භූත ආශ්චර්යයන් කිහිපයක් මගින් සර්වබලධාරී අල්ලාහ් ඔහුව ශක්තිමත් කර ඇත. සූරා අල්-කහ්ෆ්හි ආරම්භයේ සඳහන් ආශ්චර්යයන් හා වදන් තුළින් ඒ සඳහා ආරක්ෂාව ලැබේ. එය දජ්ජල් මිනිසාට මතු කර පෙන්වන අර්බුදවලට වඩා බලවත් දෑ එහි ඇති බැවිනි. එබැවින් කවරෙකු එය පරිශීලනය කර බලන්නේ ද ඔහු දජ්ජාල්ගේ අර්බුදයට කිසිවිටෙක ලක් වන්නේ නැත. තවත් වාර්තාවක: එම සූරාවේ අවසන් පාඨ දහය යනුවෙන් සඳහන් වී ඇත. එනම් "අෆහසිබල්ලදීන කෆරූ අය් යත්තකදූ..." යන පාඨයේ සිට ය.

http://www.sunnah.global/hadeeth/si/show/6265